C
339.46
RAN

# ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය හා දරිද්‍රතාවය 1973 - 1996 ආනුභවික විශ්ලේෂණයක්

# Economic Growth and Poverty in Sri Lanka 1973 – 1996: An Empirical Study.

UNIVERSITY OF PERADENIYA
4-10-2001
LIBRARY

එම්.බී. රණතිලක

PERMANENT REFERENCE
FOR USE IN THE
LIBRARY ONLY

මෙම ස්වාධීන නිබන්ධනය ශ්‍රී ලංකාවේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දර්ශනපති උපාධිය (ආර්ථික විද්‍යාව) සඳහා ඉදිරිපත් කරනු ලබන්නකි.

ආර්ථික විද්‍යා දෙපාර්තමේන්තුව
පේරාදෙණිය විශ්වවිද්‍යාලය
පේරාදෙණිය

544615

## සංක්ෂිප්තය

වර්තමාන ලෝකයේ දරිද්‍රතාවය දරුණුතම ප්‍රශ්ණයක් ලෙස හදුනාගෙන ඇත. දරිද්‍රතාවය පිටු දැකිම ලෝක ආර්ථිකය මුහුණ දෙන ප්‍රබලතම අභියෝගයක් වේ. මේ අනුව, ගැටළුව නම්, ආර්ථික වර්ධනය දරිද්‍රතාවය මැඩලීමට කෙතරම් වැදගත් වේද? ආර්ථික වර්ධනයේ ප්‍රතිලාභ භුක්තිවිදිනු ලබන්නේ කවුරුන්ද? යන්න සහ එය කුමන සාධක මත රදා පවතියිද? යන්නයි.

දරිද්‍රතාවය තීරණය කරන සූක්ෂම සාධක ලෙස ආදායම් මාර්ග, මානව සම්පත්, පවුලේ සාමාජික සංඛ්‍යාව, වත්කම්, භූගෝලීය පිහිටීම සහ යටිතළ පහසුකම්, හදුනාගත හැකි වන අතර සාර්ව සාධක ලෙස සමස්ථ ආර්ථික වර්ධනය, ආංශික වර්ධනයන්, සේවානියුක්තිය හා සේවා වියුක්තිය, උද්ධමනය හා ආහාර ද්‍රව්‍ය මිළ, ගෙවුම් ශේෂය හා විනිමය අනුපාතිකය සහ රාජ්‍ය සුභසාධන වියදම් ආදිය හදුනාගත හැකිය. මෙම සාධක වෙන් වෙන්ව මෙන්ම එකිනෙක හා බද්ධවද දරිද්‍රතාවය කෙරෙ බලපානු ලබයි.

මෙම පර්යේෂනාත්මක නිබන්ධනය මගින් 1973 සිට 1996 කාලය තුළ ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාවය අතර පවතින සම්බන්ධතාවය පරීක්ෂාකර බැලීම ප්‍රධාන අරමුණ විය. එහිදී ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය මර්ධනය කිරීම සඳහා සාපේක්ෂව වැඩි වැදගත් සාධක මොනවාද? සහ සලකාබලන කාලය තුළදී එම සාධක වල වැදගත්කම කුමක් ද? සැලකිල්ලට ගනු ලැබූ අනෙකුත් කරුණු වේ. මෙම සම්බන්ධතාවය පරීක්ෂාකර බැලීමේදී හමුවන ප්‍රධාන ගැටලුව නම් මෙම කාලාන්තරය තුළ දරිද්‍රතාවය මැන තිබෙන්නේ වසර 6කට පමණක් බවයි. ඔම නිසා ප්‍රථමයෙන් දරිද්‍රතා මිණුම් උපයෝගී කරගෙන වසර 24 සදහා වාර්ෂික දරිද්‍රතා ශ්‍රේණියක් ගොඩනංවනු ලබයි. ඊන් පසුව මෙම දරිද්‍රතා ශ්‍රේණිය උපයෝගී කරගෙන වර්ධනය ඇතුලු සාර්ව ආර්ථික සාධකයන් හා දරිද්‍රතාවය අතර තිබෙන සම්බන්ධතාවය ආර්ථිකමිතික ක්‍රම යොදා පරීක්ෂා කරනු ලබයි.

දරිද්‍රතා දර්ශකයන් පල වී තිබෙන ප්‍රධාන අධ්‍යයන දෙකකින් ලබාගත් අතර, සාර්ව ආර්ථික විචල්‍යයන් පිළිබද දත්ත් මහ බැංකු වර්තා වලින් ලබාගෙන ඇත.

ආර්ථික වර්ධනය දරිද්‍රතාවය මර්ධනය කෙරෙහි බලපෑම් එල්ලකරනු ලැබුවද එහි වැදගත්කම වෙනත් කරුණු කිහිපයක් මත රදාපවතී. ආර්ථිකමිතික ආකෘති මගින් දරිද්‍රතාවය හා වර්ධනය අතර සම්බන්ධතාවය විශ්ලේෂණය කිරීමේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය සහ දරිද්‍රතාවය අතර වෙසෙසි සම්බන්ධතාවයක් දැකිය නොහැකි මුත් ආංශික වර්ධනයන් හා දරිද්‍රතාව අතර වෙසෙසි සම්බන්ධතාවක් පවතී. එහිදී කාර්මික අංශයේ වර්ධනය, වී නිමැවුමේ වර්ධනය සහ තේ නිමැවුමේ වර්ධනය ඉතාමත් වැදගත් සාධක වී තිබේ. සේවා අංශයේ වර්ධනය මගින් දරිද්‍රතාවය මර්ධනයට සිදුවී නැත.

එක පුද්ගල ආදායම, දරිද්‍රතාවය මර්ධනය කිරීමේදී ඉතා වැදගත් සාධකයක් වේ. නමුත් මෙහිදී පවතින දළ ජාතික නිෂ්පාදිතය කොතරම් සාධාරණ ආකාරයෙන් බෙදීගොස් ඇතිද යන්න ගැටළුවකි. එසේම ආහාර මිළ දර්ශකයේ ඉහළ යාම දරිද්‍රතාවය සමග ඍජු ධන සම්බනධතාවයක් දක්වයි. අධ්‍යාපන වියදම් සහ සෞඛ්‍යය වියදම් දරිද්‍රතාවය සමග වෙසෙසි සම්බන්ධතාවයක් නොදක්වයි.

මේ අනුව පෙනී යන්නේ ශ්‍රී ලංකාවේ දරිද්‍රතාවය අඩු කිරීමට නම් විශේෂයෙන්ම කෘෂි අංශයේ දියුනුව දිරිමත් කළ යුතු බවයි. මල මට්ටම ස්ථාවරව පවත්වා ගැනීම සඳහා ක්‍රියාමාර්ග යෙදියයුතු බවයි. එමෙන්ම කාර්මික අංශයේ දියුනුවද දිරිමත් කළ යුතු බව පෙනේ.